# අය-වැය වාර්තාව

# 2023

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

# පටුන

| | පිටු අංකය |
|---|---|
| 1. සභාපතිතුමාගේ අයවැය පණිවිඩය | 01 |
| 2. ලේකම්තුමියගේ අයවැය පණිවිඩය | 02 |
| 3. ප්‍රාදේශිය සභාවේ දැක්ම සහ මෙහෙවර | 03 |
| 4. සභාපතිතුමාගේ අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය | 04-05 |
| 5. මන්ත්‍රී නාම ලේඛනය | 06 |
| 6. බල ප්‍රදේශය පිළිබද කෙටි හැදින්වීමක් | 07 |
| 7. බල ප්‍රදේශයේ සිතියම | 08 |
| 8. බල ප්‍රදේශයේ ග්‍රාම නිළධාරී වසම් ලේඛණය | 09 |
| 9. සභාවේ ප්‍රධාන කාර්යයන් හා වැඩසටහන් අය වැය ක්‍රමය | 10-11 |
| 10. සංවිධාන සටහන | 12 |
| 11. සංඛ්‍යා ලේඛණ තොරතුරු | 13-15 |
| 12. කාර්ය මණ්ඩල තොරතුරු | 16 |
| 13. 2023 අයවැය සාරාංශය | 17-22 |
| 14. 2023 විස්තරාත්මක පුනරාවර්තන ආදායම් ඇස්තමේන්තු | 23-26 |
| 15. 2023 විස්තරාත්මක පුනරාවර්තන වියදම් ඇස්තමේන්තු | 27-37 |
| 16. 2023 ප්‍රාග්ධන ආදායම් හා වියදම් ඇස්තමේන්තු | 38-39 |
| 17. 2023 සාරාංශ ආදායම් ඇස්තමේන්තු | 40-45 |
| 18. 2023 සාරාංශ වියදම් ඇස්තමේන්තු | 46-51 |
| 19. ගාස්තු උපලේඛන | 52-74 |

# කරන්දෙණිය ප්‍රාදේශීය සභාව
# 2023 වර්ෂය
## ගරු සභාපතිතුමාගේ අයවැය පණිවුඩය

සභාවේ මන්ත්‍රීවරයෙක් වශයෙන් කටයුතු කරමින් හා 2018 වර්ෂයේ තෙවන වරට ද ඔබගේ වරමින් මෙම සභාවේ සභාපතිධුරය ලබා ජනතා සේවය පෙරදැරි කොට කටයුතු කිරීමට අවස්ථාවක් හිමි වීම පිළිබඳව මා බෙහෙවින් සතුටට පත්වෙමි.

කරන්දෙණිය ප්‍රාදේශීය සභාව නියෝජනය කිරීමේ ජනවරම මට ලබා දුන් මා හිතාදර කරන්දෙණිය ප්‍රදේශයේ සමස්ථ ජනතාවට මාගේ ගෞරව පූර්වක කෘතවේදීත්වය පුද කරමි. මා කෙරෙහි තැබූ විශ්වාසය ඉදිරියටත් ගෙන යමින් ජනතා අවශ්‍යතාවයන් ඉටු කිරීම මූලික අරමුණ පෙර දැරි කොටගෙන උපරිමයෙන් කටයුතු කරන බව කාරුණිකව සිහිපත් කරමි.

2023 වර්ෂය සඳහා මා විසින් ඉදිරිපත් කරනු ලබන එකොලොස්වන අයවැය වෙනුවෙන් සැලසුම් ඉදිරිපත් කිරීමට ලැබීම මහත් භාග්‍යයක් කොට සළකමි.

ජනතාව මා කෙරෙහි විශ්වාසය තබමින් ලබා දී ඇති බලය , ජනතාවගේ අවශ්‍යතාවයන් වෙනුවෙන්ම ක්‍රියාත්මක කිරීමෙහි ලා නොපැකිළව කටයුතු කරන අතර එහිදි පැමිණෙන නොයෙක් වූ අභියෝග කෙරෙහි නොසැලි මුහුණ දෙමින් මූල්‍ය දුෂ්කරතාවයන් මධ්‍යයේ ද ඔබ වෙත උපරිම සේවයක් ලබා දීමට කටයුතු කරන ලද බව සිහිපත් කරමි.

සභාවක් ලෙස ගරු මන්ත්‍රී මණ්ඩලය සමඟ අපක්ෂපාතීව කටයුතු කරමින් ජනතාවට වඩාත් හිතකර වන්නා වූ තීරණ ගනිමින් බල ප්‍රදේශයේ සංවර්ධනය මූලික කොටගත් සැලසුම් ,ක්‍රියාමාර්ග කෙරෙහි මහත් කැපවීමෙන් ක්‍රියා කරන බවත් ජනතා ශුභසාධනය කෙරෙහි කැපවීම මා වෙත පැවරුණු ගෞරවණීය වගකීමක් ලෙස සිතනු කැමැත්තෙමි.

ප්‍රදේශයේ සංවර්ධනය වෙනුවෙන් අවශ්‍ය ප්‍රතිපාදන ප්‍රමාණවත් ලෙස ලබා ගැනීමට අපේක්ෂා කරන අතර,එම ප්‍රතිපාදන ප්‍රදේශයේ ප්‍රමුඛ සංවර්ධන කාර්යයන් කෙරෙහි යෙදවීම වෙනුවෙන් මහත් උද්යෝගීමත්ව කටයුතු කරමි. කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජනතාවගේ ශුභසාධනය වෙනුවෙන් කටයුතු කිරීමට ලැබීම මා ලැබූ භාග්‍යයක් කොට සලකන අතර ඒ සඳහා කැපවීමෙහි ලා මා හට උපදෙස් ලබා දෙන දකුණු පළාත් පාලන කොමසාරිස්තුමා සහ සහකාර පළාත් පාලන කොමසාරිස්තුමා ගෞරවයෙන් සිහිපත් කරන අතර මා හට නිබඳ සහයක් ලබා දෙමින් ධෛර්යයක් ශක්තියක් වූ ප්‍රාදේශීය සභාවේ ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රී මණ්ඩලයටත් ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලයටත් අයවැය ලේඛනය සැකසීම සඳහා සහය ලබාදුන් සියලු දෙනා වෙත මාගේ හෘදයාංගම ස්තූතිය පුද කරමි.

ගාමිණී අමරවංශ මුණුගොඩ,
සභාපති,
කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.

**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව**
**2023 වර්ෂය**
**ගරු ලේකම් තුමියගේ අයවැය පණිවුඩය**

දකුණු ලක ගාලු දිසාවේ පිහිටි කුරුඳුගහහැතැක්ම,ඌරගස්මංහන්දිය හා කරන්දෙණිය යන ප්‍රධාන නගර ඇතුලුව පළාත් පාලන කොට්ඨාස දොළහකින් සැදුම්ලත් කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අභිවෘද්ධිය පතමින් 2023 වර්ෂය අයවැයට සුභාශිංසන එක් කිරීමට ලැබීම භාග්‍යයක් කොට සලකමි.

2023 වර්ෂය සඳහා බල ප්‍රදේශයේ ජනතාව වෙත ඉටුවිය යුතු වගකීම් හා යුතුකම් ඉටු කිරීමට අදාළ ඉලක්ක සංඛ්‍යාත්මකව පිළිබිඹු කරමින් මෙවර අයවැය ලේඛනය ඉදිරිපත් කර ඇත. ජනතා අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ඊට අදාළ සැලසුම් හා සංවර්ධන කටයුතු සාක්ෂාත් කර ගැනිමට 2023 වර්ෂයේ මූල්‍යමය මෙහෙයුම් කරන ආකාරය මෙම අයවැය ලේඛනයේ අන්තර්ගතයයි.සීමිත මූල්‍ය හා භෞතික සම්පත් හමුවේ ජනතාවගේ සේවය පිණිස උපරිම කැපවීමෙන් හා උනන්දුවෙන් කටයුතු කිරීම අපගේ අපේක්ෂාවයි.

අයවැය සාක්ෂාත් කර ගැනිමට අදාළ ඉලක්ක ළඟා කර ගනු වස් ගරු සභාපතිතුමා ඇතුළු ගරු මහජන නියෝජිතයින් ගනු ලබන උත්සාහය හා කැපවීම ප්‍රසංශනීය වන අතර පක්ෂ භේදයකින් තොරව ප්‍රදේශයේ ජනතාව වෙත සේවා සලසනු වස් දෙනු ලබන සහයෝගය අගය කළ යුතුව ඇත. තවද මා ප්‍රමුඛ ආයතනික කාර්යමණ්ඩලය වෙත අපගේ රාජකාරි ඉටුකිරීමේ දී ලබා දෙන සහයෝගය අගය කිරීමටද මෙය අවස්ථාවක් කර ගනිමි.

නිබඳ සහාය ලබා දෙන විෂය භාර ගරු අමාත්‍යතුමා ඇතුළු ගරු මන්ත්‍රීවරුන් කෘතඥව සිහි කරමි.අමාත්‍යාංශ ලේකම් තුමා, දකුණු පළාත් පළාත් පාලන කොමසාරිස්තුමා හා ගාල්ල නියෝජ්‍ය පළාත් පාලන කොමසාරිස්තුමාගෙන් හා විමර්ශණ නිළධාරි වෙතින් ලැබෙන උපදෙස් හා මහපෙන්වීම අතිශයින් අගය කරමි.ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට නිබඳ සහය දෙන සහෝදර කාර්යමණ්ඩලය ද ගෞරවයෙන් සිහිපත් කරමි.

බල ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් 2023 වර්ෂය තුලදී සියළු පාර්ශව එකමුතුව කටයුතු කරමින් කරන්දෙණිය දකුණුලක විශිෂ්ටතම පුරවරය ලෙස ගොඩනැගීමට එක්සිත්ව අධිෂ්ඨාන කරගනිමු.

**පී.එච්.ටී.කේ.හේමචන්ද්‍ර**
**ලේකම්.**
**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.**

# කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

## දැක්ම

කාර්යක්ෂම හා ඵලදායී සේවාවන් තුළින්
දකුණු ලක විශිෂ්ටතම පුරවරයක්.

## මෙහෙවර

ආයතනයේ දැනට පවත්නා සියළු සම්පත්
කාර්යක්ෂමව හා ඵලදායි ලෙස කළමනාකරණය
කරමින්, වඩාත් දියුණු මංමාවත්, සෞඛ්‍ය
පහසුකම් හා මහජන උපයෝගීතා සේවා
ජනතාව වෙත සලසා දී, එමඟින් මහජන සුබ
විහරණය සහ සුබසාධනය ප්‍රශස්ථ ලෙස
සපුරාලමින් සුරක්ෂිත වූත්, සුන්දරවූත්,
වටපිටාවක් සකස් කිරීම.

# කරන්දෙණියේ ප්‍රාදේශීය සභාව

## 2023 වර්ෂය සඳහා වන අයවැය ප්‍රතිපත්ති ප්‍රකාශය

2022 වර්ෂය තුළ සිදු කරන ලද කර්තව්‍යයන් තවදුරටත් පුළුල් කරමින් කරන්දෙණිය දකුණුලක විශිෂ්ටතම පුරවරය ලෙස සංවර්ධනය කිරීම පෙරදැරි කොට ගෙන 2023 වර්ෂය සඳහා පහත සාරාංශගත ඉලක්කගත අරමුණු සාක්ෂාත් කර ගැනීමට මා විසින් අපේක්ෂා කෙරේ.

i. රාජකාරී කටයුතු විෂයෙහි ලා දැනට පවතින ප්‍රමාදයන් හා අකාර්යක්ෂමතාවයන් හඳුනාගෙන ඊට පිළියම් යෙදීම හා සේවා ඌණ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කිරීමට කටයුතු කිරීම.

ii. සභාව සතු ඉඩම් පවරා ගැනීම් කටයුතු විධිමත් ව සිදු කිරීම.

iii. ප්‍රදේශයේ ජනතාව වෙත සහන සැලසීමේ අරමුණ පෙරදැරිව නව ගලි බවුසරයක් මිල දී ගැනීම.

iv. ගැමි අරුණ වැඩසටහන සිදු කරන සේවාවන් තවදුරටත් පුළුල් කරමින් ජනතා අවශ්‍යතා හඳුනාගෙන ඒ සඳහා අදාළ පියවරයන් ගැනීම.

v. ප්‍රදේශයේ ප්‍රධාන නගරයක් වන ඌරගස්මංහන්දිය නගරයේ වටරවුම් මාර්ගය ඉදිකිරීම.

vi. කරන්දෙණිය හා කුරුඳුගහහැතැක්ම නගරයේ ඉදි කරන පොදු වැසිකිළි පද්ධතිය නිසි පරිදි පවත්වාගෙන යාම.

vii. ජලභීතිකා රෝගය සඳහා සුනඛයින් එන්නත් කිරීම හා වන්ධ්‍යකරණයට ලක් කිරීමේ කටයුතු සෞඛ්‍ය නිලධාරී කාර්යාලය හා සම්බන්ධව ක්‍රියා කිරීම.

viii. දුෂ්කර මාර්ග හා ජනතාව අධික ලෙස භාවිත කරන මාර්ග හඳුනාගෙන සංවර්ධනය කිරීම.

ix. ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රමුඛ කාර්යයක් ලෙස හඳුනා ගනිමින් ඊට අදාළව ජල මනු ලබා දීම සහ ජල පෙරන ලබාදීම.

x. ජනතා අවශ්‍යතාවන් හඳුනාගෙන ලංකා විදුලි බල මණ්ඩලයේ අනුමැතිය යටතේ නව විථි ලාම්පු සවි කිරීම හා පවත්නා විථි ලාම්පු නිසි පරිදි නඩත්තුව

xi. ප්‍රදේශයේ කාන්තාවන්ගේ හා ළමයින්ගේ ආරක්ෂාව ප්‍රමුඛ වගකීමක් ලෙස සලකා ප්‍රදේශයේ වීථිපහන් නඩත්තුව ආදී කටයුතු සඳහා නව විදුලි වාහනයක් මිලදී ගැනීම.

xii. බල ප්‍රදේශයේ ක්‍රීඩක කුසලතාවයන් ඔප් නැංවීම සඳහා ක්‍රීඩා සමාජ සඳහා ක්‍රීඩා උපකරණ පරිත්‍යාග කිරීම.

xiii. බල ප්‍රදේශයේ දක්ෂතා පෙන්වන ජාතික මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට ආධාර උපකාර කිරීම හා විදෙස් පුහුණු සංචාර සඳහා එක්වන ක්‍රීඩක ක්‍රීඩිකාවන්ට මූල්‍ය අනුග්‍රහය දැක්වීම

xiv. 2023 වර්ෂය තුලදීත් පාඨක සමාජ සම්බන්ධ කර ගනිමින් සාහිත්‍ය මහෝත්සවයක් පැවැත්වීම.

xv. සභාවේ සුභ සාධක සංගමය මඟින් වාර්ෂික විනෝද ගමනක් සංවිධානය කිරීම.

xvi. බල ප්‍රදේශයේ සියළුම නාගරික ප්‍රදේශ ආවරණය වන පරිදි වරිපනම් අය කිරීමට කටයුතු කිරීම.

xvii. දැනට තක්සේරු සිදු කර ඇති වරිපනම් ප්‍රතිශෝධනයේ තීරණ ක්‍රියාත්මක කර ඒ අනුව ප්‍රතිශෝධිත බදු මුදල් අය කර ගැනීම.

xviii. ප්‍රදේශයේ පෙරපාසල් ,දහම් පාසල්,සමිති සංගම්,මාතෘ සායන මධ්‍යස්ථානයන් හි භෞතික සම්පත් වැඩිදියුණු කිරීම සඳහා සහාය ලබා දීම.

xix. ප්‍රදේශයේ ප්‍රධාන නගරයක් ආශ්‍රිතව නව ළමා උද්‍යානයක් ඉදිකිරීමට කටයුතු කිරීම.

xx. පාසැල් හැරයන තරුණ දරු පරපුර ඉලක්ක කර ගනිමින් වෘත්තීය පුහුණුව සඳහා මඟ පෙන්වීම හා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

xxi. බලප්‍රදේශයේ පෙරපාසල් දරුවන්ගේ දෙමාපියන් සඳහා ආකල්ප කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් සංවිධානය කිරීම

xxii. මහඒදණ්ඩ නගරයේ වෙළඳ සංකීර්ණයක් සමඟ ප්‍රධාන කාර්යාලය පිහිටුවීම

ප්‍රදේශයේ සංවර්ධනය ළඟා කරගැනීමේ ලා ගන්නා තීරණ හමුවේ ජනතා සහභාගීත්වය සඳහා ද ප්‍රමුඛස්ථානයක් ලබා දීමට කටයුතු කරන අතර 2023 වර්ෂය සඳහා වන මෙම අයවැය ඔබ වෙත ඉදිරිපත් කරනුයේ එම සංවර්ධනය කටයුතු සඳහා බදු ගෙවන ජනතාවගෙන්ද සහයෝගය නොමඳව ලැබෙනු ඇති යන අපේක්ෂාවෙන් හා ප්‍රදේශයේ සංවර්ධනය වඩාත් ඉහළ නංවා අනාගත පරපුර වෙත වඩාත් සුන්දර පුරවරයක් ගොඩ නැඟීම පෙර දැරී කොටගෙනය.

**ගාමිණි අමරවංශ මුණුගොඩ,**
**සභාපති,**
**කරන්දෙණිය ප්‍රාදේශීය සභාව.**

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

## මන්ත්‍රී නාම ලේඛනය.

| | |
|---|---|
| 1. ගාමිණී අමරවංශ මුණුගොඩ මයා | ගරු සභාපති |
| 2. එස්.පී.නිමල් බන්දු මයා | ගරු උප සභාපති |
| 3. එම්.එස්.කපිල කුමාර මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 4. අජිත් කුමාර කරුණාරත්න මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 5. ගාල්ලගේ ළහිරු සඳරුවන් සුරවීර මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 6. ඩී.කේ.ජීවන්ති වීරසිංහ මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 7. බී.එච්.ශ්‍යාමා නිශාන්ති විමලවීර මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 8. පී.එච්.සුරේෂ් සම්පත් කුමාර මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 9. සමීර චතුරංග ආරියරත්න මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 10. ටී.එච්. කමල් හේවගේ මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 11. රම්‍ය ශ්‍රී විජේතුංග මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 12. පී.එච්.චම්පික කුෂාන් ගුණසිංහ මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 13. නිහාල් ප්‍රේමතිලක සුබසිංහ මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 14. මොහොමඩ් කියාස් මොහොමඩ් සිරාස් මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 15. කේ.ඩී.චන්ද්‍රිකා කාන්ති වීරසිංහ මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 16. ශ්‍රියානි පුංචිහේවා මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |
| 17. ඒ.ඒ.සරත් ගුණරත්න මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 18. ඕ.කේ.ධම්මික සුසන්ත මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 19. කේ.ඩී.බන්දුසිරි මයා | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී |
| 20. ඒ.පී.හර්ෂණී දිපිකා මිය | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී |

# සභා බල ප්‍රදේශය පිළිබද කෙටි හැදින්වීමක්

ගාල්ල දිස්ත්‍රික්කයේ කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය වෙරළ බඩ කලාපයට මදක් ඔබ්බෙන් මද තැනිතලා සහිත භූමි භාගයක පිහිටා ඇත.නැගෙනහිර දේශාංශ 80-5 සිට 80-10 අතරද උතුරු අක්ෂාංශ 6-15 සිට 6-20 අතරද පිහිටා ඇත.

කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය මායිම්ව ඇත්තේ උතුරින් බෙන්තර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද, ගිණිකොනින් ඇල්පිටිය හා වැලිවිටිය දිවිතුර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද, දකුණින් අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද, බටහිරින් බලපිටිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයද මායිම්ව වේ.


කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය කරන්දෙණිය මැතිවරණ කොට්ඨාසයට අයත්ය.මෙහි විශාලත්වය හෙක්ටයාර 8423 කි.(වර්ග කි.මී.84) පරිපාලනමය වශයෙන් ග්‍රාම නිළධාරී කොට්ඨාස 40 කින් සමන්විත වේ.ගාල්ල දිස්ත්‍රික්කයේ මුළු බිම් ප්‍රමාණයෙන් 5% ක් මෙම කොට්ඨාසයට අයත් වේ.2021 ජන හා නිවාස සංගණන තොරතුරු අනුව මුළු ජනගහනය 74606 කි.

කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ආර්ථික තත්වය පිළිබද විමසීමක් කිරීමේදි මෙහි ප්‍රධානතම ආදායම් මාර්ගය වනුයේ කුරුදු වගාවයි.ප්‍රදේශයේ මුළු බිම් ප්‍රමාණයෙන් 43% ක පමණ මෙම වගාව ව්‍යාප්ත වී ඇති අතර පදිංචිකරුවන්ගෙන් 80% ක අධික ප්‍රමාණයකගේ ජීවනෝපාය මාර්ගය මෙම කුරුදු වගාව ආශ්‍රිතව සිදුවේ.ඊට අමතරව වී, තේ, පොල්, රබර් වගාවද සිදුකරයි.කර්මාන්ත සංයුතිය සලකා බැලීමේදි අපනයන මට්ටමේ කර්මාන්ත, සම්ප්‍රදායික කර්මාන්ත, කුඩා කර්මාන්ත හා ගෘහස්ත කර්මාන්ත ලෙස වර්ග කර දැක්විය හැක.39 ඩී යටගල ග්‍රාම නිළධාරි වසම තුළ කර්මාන්තපුරය ස්ථානගත වී ඇති අතර අපනයන මට්ටමේ කර්මාන්ත 10 ක් පමණ ඇත.නිමි ඇදුම්, කුරුදු හා කුරුදු ආශ්‍රිත නිශ්පාදන, පාවහන්, බොත්තම්, කාඩ්බෝඩ්, තීන්ත, ප්ලාස්ටික් නිෂ්පාදන යනාදිය අපනයනය සඳහා නිෂ්පාදනය කරනු ලබන අතර මෙමගින් ඍජු හා වක්‍ර රැකියා දහස් ගණනක් ලබාදීමට සමත්ව ඇත.


සංචාරක ආකර්ශනීය ස්ථාන ලෙස ඓතිහාසික ගලගොඩඅත්ත ශ්‍රී ශෛලතලාරාම විහාරස්ථානයෙහි දකුණු ආසියාවේ විශාලතම පැරණි සැතපෙන බුදුපිළිම වහන්සේ සහ පෙහෙඹියකන්ද ග්‍රාම නිළධාරි වසමට අයත් කොහිලවගුර යාබදව ඇති මාදු ගගද ලංකාවේ තෙවන රැම්සා තෙත් බිම් ලෙස සැලකෙන මාදු ගංගාවේ තීරයක්ද මෙම වසමට අයත් වේ.මෙය ජෛව විවිධත්වයෙන් අනූන වූ ස්වභාවික පරිසර පද්ධතියෙන් යුතු දේශීය විදේශීය සංචාරකයින්ගෙන් ආකර්ශනීය වූ ස්ථානයකි. කුරුදුගහහැතැක්ම අධි වේගී පිවිසුම් මාර්ගය නිසා බල ප්‍රදේශය දෙස් විදෙස් සියලු දෙනා හදුනාගත් අතර ඉතා පහසුවෙන් ළගාවිය හැකි බැවින්ද දෙස් විදෙස් සංචාරකයන්ගේ පැමිණීම ඉහල ගිය අතර ඉදිරියේදී සංචාරක පුරවරයක් බවට පත්වීමේ හැකියාව පවතී.

ඓතිහාසික වශයෙන් ගත් විටද කරන්දෙණිය ප්‍රදේශය විශාල වැදගත්කමක් උසුලන අතර කරන්දෙණිය දකුණ ග්‍රාම නිලධාරි වසමෙහි ගලගොඩඅත්ත ශ්‍රී ශෛලතලාරාම විහාරස්ථානයෙහි දකුණු ආසියාවේ විශාලතම පැරණි සැතපෙන බුදුපිළිම වහන්සේ නිර්මාණය කර ඇත.ඓතිහාසික වටිනාකමකින් යුතු සෙල් ලිපියක් ද මෙහි ඇත.එමෙන්ම හිපන්කන්ද ශ්‍රී පාද මහා විහාරස්ථානයේ ශ්‍රී පාද ලාංඡනය සහ පෞරාණික සෙල්ලිපියක්ද දියපිටගල්ලන ගංඉම ශ්‍රී ධර්මාරාම විවේකාශ්‍රම විහාරස්ථානයේ සහ පෙහෙඹියකන්ද ශ්‍රී අභයතිස්සාරාම විහාරස්ථානයේ දර්ශණීය ලෙස නිර්මාණය කරන ලද මූර්ති නිර්මාණ කිහිපයක්ද ඇත .

# බල ප්‍රදේශයේ සිතියම



# කරන්දෙණිය ප්‍රදේශීය සභාවට අයත් ග්‍රම නිලධාරී වසම් සහිත සිතියම



# කරන්දෙණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ග්‍රාම නිලධාරි වසම් ලේඛණය

| අනු අංකය | ග්‍රා.නි. අංකය | ග්‍රා.නි. කොට්ඨාශය | භූමි ප්‍රමාණය(හෙක්ටයාර) |
|---|---|---|---|
| 1. | 39 | ඌරගස්මංහන්දිය-දකුණ | 110 |
| 2. | 39 ඒ | ඌරගස්මංහන්දිය-උතුර | 135 |
| 3. | 39 බී | මීගස්පිටිය | 229 |
| 4. | 39 සී | ඌරගස්මංහන්දිය-නැගෙනහිර | 270 |
| 5. | 39 ඩී | යටගල | 149 |
| 6. | 39 ඊ | මැන්ඩෝරාවල | 74 |
| 7. | 39 එෆ් | හල්ගහවේල්ල | 125 |
| 8. | 39 ජී | මාබිංගොඩ | 164 |
| 9. | 39 එච් | ගල්පොත්තාවල | 226 |
| 10. | 39 ජේ | වල්ඉගුරුකැටිය | 325 |
| 11. | 41 | මාගල උතුර | 209 |
| 12. | 41 ඒ | හිපන්කන්ද | 237 |
| 13 | 41 බී | කලුවලගොඩ | 187 |
| 14. | 41 සී | ලේනගල්පළාත | 196 |
| 15 | 41 ඩී | සිරිපුර | 105 |
| 16. | 41 ඊ | බෙලිගස්වේල්ල | 220 |
| 17. | 41 එෆ් | දියපිටගල්ලන | 146 |
| 18. | 91 | කරන්දෙණිය උතුර | 178 |
| 19. | 91 ඒ | කරන්දෙණිය දකුණ | 95 |
| 20. | 91 බී | රන්දෙණිගම | 323 |
| 21. | 91 සී | දංගහවිල | 51 |
| 22. | 91 ඩී | උණගස්වෙල | 339 |
| 23. | 91 ඊ | මහගොඩ | 85 |
| 24. | 91 එෆ් | එගොඩවෙල | 312 |
| 25 | 92 | බොරකන්ද | 260 |
| 26. | 92 ඒ | මඩකුඹර | 155 |
| 27 | 92 බී | මණ්ඩකන්ද | 87 |
| 28 | 92 සී | දිවියගහවෙල | 167 |
| 29 | 92 ඩී | තල්ගහවත්ත | 564 |
| 30 | 92 ඊ | කිරිනුගේ | 339 |
| 31 | 92 එෆ් | මහඇදණ්ඩ | 69 |
| 32 | 93 | කුරුදුගහහැත්ක්ම | 227 |
| 33 | 93 ඒ | පහල කිරිජේද්ද | 77 |
| 34 | 93 බී | ඉහල කිරිජේද්ද | 112 |
| 35 | 93 සී | අගනකැටිය | 394 |
| 36. | 93 ඩී | ගලගොඩඅත්ත | 192 |
| 37. | 93 ඊ | ජයබිම | 102 |
| 38. | 95 | මාගල දකුණ | 636 |
| 39. | 95 ඒ | අගුළුගල්ල | 441 |
| 40. | 95 බී | පෙහෙබියකන්ද | 164 |

# කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

### හැඳින්වීම

පරිපාලන සහ සංවර්ධන කටයුතුවලට අදාලව තීරණ ගැනීමේ ක්‍රියාවලියෙහි ජනතාවට ප්‍රාදේශීය මට්ටමින් ඵලදායි ලෙස සහභාගි වීම සඳහා වැඩි අවස්ථාවක් සලසා දීමේ අරමුණ ඇතිව බලතල කාර්යයන් සහ කර්තව්‍යයන් නිශ්චය කිරීම සඳහා ඊට සම්බන්ධ අනුශාංගික සියලු කරුණු සඳහා 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතින් ප්‍රාදේශිය සභා සංස්ථාපනය කර ඇත.

### ප්‍රධාන කාර්යයන්

- ➢ මහජනයාගේ සුභසිද්ධිය සුඛ විහරණය සඳහා අවශ්‍ය වන මහජන සෞඛ්‍ය කටයුතු සහ පරිසරය පිළිබද ව සනීපාරක්ෂක කටයුතු හා ආදාහනාගාර කටයුතු පවත්වාගෙන යාම.
- ➢ මං මාවත් තැනීම නඩත්තු කිරීම පිරිසිදු කිරීම හා ආරක්ෂා කිරීම
- ➢ වීථි පහන් නඩත්තුව ඇතුළු මහජන උපයෝගීතා සේවාවන් පවත්වා ගෙන යාම.
- ➢ පෙර පාසල් පුස්තකාල ඇතුළු සුභසාධක හා සමාජීය සේවාවන් පවත්වා ගෙන යාම හා වැඩි දියුණු කිරීම.

## වැඩ සටහන් අයවැය ක්‍රමය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනත යටතේ වූ සභාවේ බලතල හා කාර්යයන් ක්‍රියාත්මක කිරීම සම්බන්ධව සභාවේ කාර්යයන් ප්‍රධාන වැඩ සටහන් මගින් අයවැය ක්‍රමය යටතේ කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ වැඩසටහන් 06ක් යටතේ ක්‍රියාත්මක වේ.

### වැඩ සටහන් අංක 01 - පොදු පරිපාලනය හා කාර්ය මණ්ඩල සේවා

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් වශයෙන් පළාත් පාලන ආයතනයෙහි සමස්ත කාර්ය මණ්ඩලය මෙහෙයවීම හා පාලනයත් පොදු අරමුදල පාලනය කිරීමත් ආදායම් මාර්ග හදුනාගෙන ඒවා සාර්ථකව එකතු කිරීම හා ගිණුම් තැබීමත් වැදගත් වේ.

### වැඩ සටහන් අංක 02 - සෞඛ්‍ය සේවා

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු හා කාර්යයන් වන්නේ බල ප්‍රදේශයේ කැළි කසල ඉවත් කිරීම තුලින් නිසි සෞඛ්‍ය සේවාවක් ලබා දීම, රෝග නිවාරණ කටයුතු කිරීම, සෞඛ්‍ය සායන පැවැත්වීම සඳහා අවශ්‍ය වන ඖෂධ වර්ග ලබාදීම, ආයුර්වේද බෙහෙත් ශාලා පවත්වාගෙන යාම, ආදාහනාගාර කටයුතු පරිසර අධිකාරියේ මග පෙන්වීම යටතේ පරිසර වැඩසටහන් ආදිය ක්‍රියාත්මක කිරීම හා ඒ සම්බන්ධව මහජනතාව දැනුවත් කිරීම ආදියයි.

## වැඩ සටහන් අංක 03 -භෞතික සැලසුම් මං මාවත් ඉඩම් හා ගොඩනැගිලි

මෙම වැඩසටහනේ ප්‍රධාන කාර්යයන් වශයෙන් ප්‍රදේශයේ මාර්ග, අතුරු මාර්ග, කාණු පද්ධති, බෝක්කු ඉදිකිරීම හා නඩත්තු කිරීම, සභාව සතු වාහන හා උපකරණ වලින් ආදායම් ඉපයීම හා නඩත්තු කිරීම දැක්විය හැක.

## වැඩ සටහන් අංක 04 -ජල සේවා

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ  ඌරගස්මංහන්දිය ජල ව්‍යාපෘතිය මගින් මහජන අවශ්‍යතා පරිදි ජලය බෙදා හැරීමට කටයුතු සිදුකිරීම,එ සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කර දීමෙන් හා නඩත්තු කටයුතු කිරීම මගින් මහජන අවශ්‍යතා ඉටුකර දීමයි.


## වැඩ සටහන් අංක 05 -වෙනත් පොදු උපයෝගීතා සේවා

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ  ප්‍රදේශයේ සති පොළවල් පැවැත්වීම, පාලනය කිරීම හා නඩත්තු කිරීම, වීථි පහන් නඩත්තු කිරීම, ප්‍රජා ශාලා පවත්වාගෙන යාම, පොදු වෙළඳපල ගොඩනැගිලි නඩත්තු කිරීම ආදියයි.

## වැඩ සටහන් අංක 06 -සුභසාධක  සේවා

මෙම වැඩසටහනේ ප්‍රධාන අරමුණු වන්නේ  පුස්තකාල සේවාවන් පවත්වාගෙන යාම, ළදරු අධ්‍යාපනය සඳහා පෙර පාසල් පවත්වාගෙන යාම ඇතුළු සුභසාධක සේවාවන් පවත්වාගෙන යාම වේ.

## කරන්දෙණිය ප්‍රාදේශීය සභාවේ සංවිධාන සටහන



# කරන්දෙණිය ප්‍රාදේශීය සභාව - පොදු සංඛ්‍යා ලේඛණ තොරතුරු

## පොදු තොරතුරු

| | | |
|---|---|---|
| පළාත | | දකුණ |
| පරිපාලන දිස්ත්‍රික්කය | | ගාල්ල |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය | | කරන්දෙණිය |
| මැතිවරණ කොට්ඨාශය | | කරන්දෙණිය |
| බල ප්‍රදේශයේ විශාලත්වය | | වර්ග කිලෝමීටර් 84 |
| ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව | | 40 |
| උප කාර්යාල සංඛ්‍යාව | | 01 |
| සභාව සතු වාහන හා යන්ත්‍ර සූත්‍ර සංඛ්‍යාව | | 17 |
| ස්ථිර සේවක සංඛ්‍යාව | | 75 |
| ආදේශක අනියම් සේවක සංඛ්‍යාව | | 21 |
| අනුමත සේවක සංඛ්‍යාව | | 89 |
| නිවාස සංඛ්‍යාව | | 20169 |
| ජනගහනය 2021 වර්ෂය | | 74606 |
| ඡන්ද දායක සංඛ්‍යාව (2021 වර්ෂය) | | 53711 |
| පුස්තකාලා | | 16 |
| පොදු ළිං | | 25 |
| ජල ව්‍යාපෘති | | 01 |
| වරිපනම් ප්‍රතිශතය | ප්‍රධාන කාර්යාලය | 7% |
| | උප කාර්යාලය | 5% |
| දිසා රෝහල | | බොරකන්ද |
| ප්‍රාදේශීය රෝහල | | ඌරගස්මන්හංදිය |
| දුරකථන අංක :- | ප්‍රධාන කාර්යාලය | 0912291539 |
| | උප කාර්යාලය | 0912264241 |
| | ෆැක්ස් | 0912291539 |

ඊමේල් karandeniyaps@ymail.com / karandeniyaps@gmail.com

| අනු අංකය | පොදු සේවා | ප්‍රධාන කාර්යාලය | උප කාර්යාලය | එකතුව |
|---|---|---|---|---|
| 1. | පොදු වෙළදපොල | 05 | 06 | 11 |
| 2. | සතිපොල සභාව සතු | 01 | 01 | 02 |
| 3. | පුස්තකාල (මහ ඒදණ්ඩ,කුරුදුගහ,ඌරගස්මන්හංදිය) | 02 | 01 | 03 |
| 4. | පොදු සුසාන භූමි (කලුවෙලගොඩ,සොහන්හන්දිය,කිරිමැටියාව ,[illegible]පොත්කන්ද,දියපිටගල්ලන, පනාපිටිය) | 02 | 04 | 06 |
| 5. | ආදාහනාගාර - උතුරු මාගල | - | 01 | 01 |
| 6. | ක්‍රීඩා භූමි | | | 10 |
| 7. | ක්‍රීඩා මණ්ඩප (යක්කටුව,සමරවීර, පී.ඩී.ඒ ප්‍රනාන්දු ,පිහිබියකන්ද ) | 04 | - | 04 |
| 8. | ආයුර්වේද බෙහෙත් ශාලා | 01 | 01 | 02 |
| 9. | පොදු වැසිකිළි (ඌරගස්මන්හංදිය, මහ ඒදණ්ඩ) | 01 | 02 | 03 |
| 11. | පෙර පාසල් (සභාව සතු) මහ ඒදණ්ඩ,නුගේතිබුකන්ද | 01 | 01 | 02 |
| 11. | පොදු ළිං | | | 21 |
| 12. | වීථි පහන් | | | 2200 |
| 13. | ප්‍රජා ශාලා (තේවත්ත,මීගස්පිටිය,බෙලිගස්වේල්ල,කොටවෙල,ගොරකගහහන්දිය,මඩකුඹුර,මහගොඩ,හලගහවේල්ල,මණ්ඩකන්ද,යක්කටුව,දංගහවිල,අමරකිර්තිගම) | | | 16 |
| 14. | වරිපනම් බදු ගෙවන දේපල සංඛ්‍යාව | 292 | 1625 | 1917 |
| 15. | අක්කර බදු ගෙවන දේපල සංඛ්‍යාව | 178 | - | 178 |
| 16. | කුලියට දී ඇති කඩ කාමර සංඛ්‍යාව | 54 | 114 | 168 |
| 17. | මාළු වෙළඳ සැල් සංඛ්‍යාව | | 01 | 01 |
| 18. | රජයේ පාසල් | - | - | 32 |

## අනෙකුත් ආයතන

| | | | | |
|---|---|---|---|---|
| 1. | කාය වර්ධන මධ්‍යස්ථාන (පෞද්ගලික) | 06 | 01 | 07 |
| 2. | මල්ශාලා (පෞද්ගලික) | | | 03 |
| 3. | වෛද්‍ය මධ්‍යස්ථාන (පෞද්ගලික) | 15 | 06 | 21 |
| 4. | ඉංග්‍රීසි බෙහෙත් ශාලා | 15 | 02 | 17 |
| 5. | අධ්‍යාපන මධ්‍යස්ථාන (පෞද්ගලික) | 05 | 03 | 08 |
| 6. | පෙර පාසල්(පෞද්ගලික) | - | - | 59 |
| 7. | පෞද්ගලික ආයුර්වේද මධ්‍යස්ථාන | | | 03 |

## සභාව සතු වෙළඳ සංකීර්ණ

| අනු අංකය | වෙළඳ සංකීර්ණයේ නම | කඩ කාමර සංඛ්‍යාව |
|---|---|---|
| 01 | කුරුදුගහහැතැප්ම වෙළඳ සංකීර්ණය | 14 |
| 02 | මහජ්දන්ඩ පැරණි වෙළඳ සංකීර්ණය | 12 |
| 03 | මහජ්දන්ඩ දෙමහල් වෙළඳ සංකීර්ණය - ඉහළ මාලය | 12 |
| | පහළ මාලය | 12 |
| 04 | තරප්පු පෙළ අසල කඩ කාමරය | 01 |
| 05 | දංගහවිල සමන් සෙනෙවිරත්න ප්‍රජා කේන්ද්‍රයේ කඩ කාමර | 04 |
| 06 | ඌරගස්මන්හංදිය නව වෙළඳ සංකීර්ණය - ඉහළ මාලය | 09 |
| | පහළ මාලය | 09 |
| 07 | සමූපකාර ගොඩනැගිල්ල - ඌරගස්මන්හංදිය | 08 |
| 08 | දකුණු පළාත් ආර්ථික ප්‍රවර්ධන ව්‍යාපෘති කඩ කාමර | 24 |
| 09 | ඌරගස්මන්හංදිය බෝධිය ඉදිරිපිට වෙළඳ සංකීර්ණය - ඉහළ මාලය | 14 |
| | පහළ මාලය | 14 |
| 10 | ඌරගස්මන්හංදිය මාළු වෙළඳසැල අසල වෙළඳ සංකීර්ණය - ඉහළ මාලය | 04 |
| | පහල මාලය | 04 |
| 11 | කුඩා කඩ කාමර | 01 |
| 12 | ඌරගස්මන්හංදිය සුපිරි වෙළඳ සංකීර්ණය | 27 |
| | එකතුව | 169 |

## සභාව සතු වාහන

| අනු අංකය | සභාව සතු වාහන වර්ගය | වාහන අංකය |
|---|---|---|
| 01 | මිට්සුබිෂි කැබ් රථය | SPPF – 7389 |
| 02 | මිට්සුබිෂි ඩබල් කැබ් රථය | 252 – 6570 |
| 03 | ඉසුසු ටිපර් රථය | SPHC – 2813 |
| 04 | ෆෝටෝන් ට්‍රක් රථය | SPLL – 6957 |
| 05 | වැෆේ ට්‍රැක්ටරය | SPRD – 4573 |
| 06 | වැෆේ ට්‍රැක්ටරය | SPRD – 3160 |
| 07 | ජෝන්ඩියර් ට්‍රැක්ටරය | SPRA – 8670 |
| 08 | මැසිෆර්ගියුසන් ට්‍රැක්ටරය | 49 – 1138 |
| 09 | ට්‍රේලර් | SPRV – 5064 |
| 10 | ට්‍රේලර් | SPRW – 8177 |
| 11 | ට්‍රේලර් | 46 - 5134 |
| 12 | ෆෝටෝන් බැකෝ ලෝඩරය | SPZA – 5217 |
| 13 | බැකෝ ලෝඩරය | SPRS – 0928 |
| 14 | මෝටර් ග්‍රේඩර් | SPZA – 5319 |
| 15 | වතුර බවුසරය | SPRX – 2238 |
| 16 | පස් තලන රෝල | YTS – 1328 |
| 17 | කම්පැක්ටර් රථය | SPLM – 5615 |

## අනුමත කාර්ය මණ්ඩලය, දැනට සිටින කාර්ය මණ්ඩලය හා පුරප්පාඩු කාර්ය මණ්ඩලය පිළිබඳ විස්තර

| අනු අංකය | තනතුර | සේවය | පන්තිය | වැටුප් ඛණ්ඩය | අනුමත සංඛ්‍යාව | දැනට සිටින සංඛ්‍යාව | පුරප්පාඩු |
|---|---|---|---|---|---|---|---|
| 01. | ලේකම් | SLAS | III | SL1-2016 | 1 | | 1 |
| 02. | පරිපාලන නිලධාරී | PPMAS | Supra | MN7-2016 | 1 | 1 | |
| 03. | ආයුර්වේද වෛද්‍ය නිළධාරි | SLAyMS | Prelim/II/I | SL2-2016 | 2 | 2 | - |
| 04. | සංවර්ධන නිළධාරි | DOS | III/II/I | MN4-2016 | 15 | 19 | - |
| 05. | තාක්ෂණ සේවා නිළධාරි | SLTS | III/II/I | MN3-2016 | 2 | 2 | - |
| 06. | පුස්තකාලයාධිපති | SLGLS | III/II/I | MN3-2016 | 3 | 3 | |
| 07. | කළමණාකරන සේවා නිලධාරී | PPAMS | III/II/I | MN2-2016 | 7 | 8 | - |
| 08. | ආදායම් පරීක්ෂක | Dept | III/II/I | MN1-2016 | 2 | 2 | - |
| 09. | පෙර පාසල් ගුරු | Dept | III/II/I | MN1-2016 | 2 | 1 | 1 |
| 10. | රියදුරු<br>*25/2014 | PDS | III/II/ISpl | PL3-2016 | 4<br>*1 | 2<br>*1 | 2 |
| 11. | බර වාහන යන්ත්‍ර ක්‍රියාකරු | Dept | III/II/ISpl | PL3-2016 | 1 | 1 | - |
| 12. | ඖෂධ සංයෝජක | Dept | III/II/ISpl | PL2-2016 | 2 | 0 | 2 |
| 13. | විදුලි කාර්මික<br>*25/2014 | PDS | III/II/ISpl | PL2-2016 | 1<br>*1 | 0<br>1 | 1 |
| 14. | ආදාහනාගාර ක්‍රියාකරු<br>*25/2014 | Dept | III/II/ISpl | PL2-2016 | 1<br>*1 | 0<br>1 | 1 |
| 15. | ජලනල ක්‍රියාකරු | Dept | III/II/ISpl | PL1-2016 | 1 | 1 | - |
| 16. | කා.කා.ස<br>*25/2014 | Dept | III/II/ISpl | PL1-2016 | 2<br>*1 | 2<br>*1 | - |
| 17. | මුරකරු<br>*25/2014 | Dept | III/II/ISpl | PL1-2016 | 2<br>*1 | 1<br>*1 | 1 |
| 18. | පුස්තකාල සහායක<br>*25/2014 | Dept | III/II/ISpl | PL1-2016 | 3<br>*4 | 1<br>* 4 | 2 |
| 19. | සෞඛ්‍ය කම්කරු<br>*25/2014 | Dept | III/II/ISpl | PL1-2016 | 8<br>*2 | 6<br>*2 | 2 |
| 20. | ආදාහනාගාර ක්‍රියාකරු සහයක<br>*25/2014 | Dept | III/II/ISpl | PL1-2016 | 1<br>*1 | 0<br>*1 | 1 |
| 21. | වැඩ ක්ෂේත්‍ර කම්කරු | Dept | III/II/ISpl | PL1-2016 | 16 | 10 | 06 |


16

# කරන්දෙණිය ප්‍රාදේශීය සභාව

## 2023 අය-වැය සාරාංශය

| | | |
|---|---|---|
| ආදායම | | |
| සභාවේ උත්පාදිත ආදායම | 53,912,248.00 | |
| ආදායම් අධාර ප්‍රතිපූර්ණ | 60,801,793.00 | |
| | | **114,714,041.00** |
| එකතු කළා | | |
| ප්‍රාග්ධන ආධාර | 58,950,000.00 | |
| ප්‍රාග්ධන වත්කම් විකිණීම | 2,900,000.00 | |
| වෙනත් | 50,785,000.00 | |
| ණය | 80,000,000.00 | |
| | | 192,635,000.00 |
| අපේක්ෂිත මුලු ආදායම | | **307,349,041.00** |
| වියදම | | |
| පුනරාවර්තන වියදම | 106,844,293.00 | |
| ප්‍රාග්ධන වියදම | 195,000,000.00 | |
| ණය ආපසු ගෙවීම් | 5,500,000.00 | |
| | | 307,344,293.00 |
| අතිරික්තය/ඌණතාවය | | **4,748.00** |